# ඉවතලන ප්ලාස්ටර් ඔෆ් පැරිස් අච්චු වලින් රටහුණු සාදා ගනිමු

1 ප්ලාස්ටර් ඔෆ් පැරිස් කැබලි වලට වෙන්කර ගන්න. මේ සඳහා මිටියක් භාවිතා කළ හැකිවේ.

2 ඇඹරුම් යන්ත්‍රයක් ආධාරයෙන් ප්ලාස්ටර් ඔෆ් පැරිස් කැබලි සියුම් ලෙස අඹරා ගන්න. මේ සඳහා වංගෙඩියක් හා මෝල්ගසක්ද යොදාගත හැකිවේ.

3 සියුම් සිදුරු සහිත දැලකින් මෙම අඹරාගත් කුඩු හලා ගන්න. සියුම් සිදුරු සහිත පෙනේරයක් වුවද භාවිතා කල හැකිවේ.

4 මෙම කුඩුවල ඇති තෙතමනය ඉවත් කිරීම සඳහා සෙන්ටිග්‍රේඩ් අංශක 180$^{0}$C ක පමණ උෂ්ණත්වයකට භාජනයක දමා රත්කර ගන්න.

5 රත්කරගත් කුඩු නිවෙන්නට තබන්න.

6 නැවත සියුම් සිදුරු සහිත දැලකින් මෙම කුඩු හලාගන්න.

7 මෙම සියුම් කුඩුවලට කෙයොලින්, වර්ණක හා ජලය එකතුකර බීටරයකින් මිශ්‍රකර ගන්න.

8 ජලය එකතුකල යුතු අනුපාතය - කුඩු රාත්තල් 5 ට වතුර පයින්ට් 3 කි.

9 මිශ්‍රකර ගත් මිශ්‍රණය රබර් අච්චුවලට වත්කර ගන්න.

10 සවිවූ හුණුකූරු ගලවා ඉවත්කර ගන්න.

11 දැල් ගසා සැකසූ උපකරණයක තබා දින 2 ක් පමණ වේලාගන්න.

12 පසුව පෙට්ටිවල අසුරා ගන්න.

## නිෂ්පාදන ක්‍රියාවලිය




**මහේෂා අයෝමි නන්දසේන**
ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකාර
කාර්මික ත.තො.සේවා
මධ්‍යස්ථානය